24

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා ගෞරව උපාධි වැඩසටහන

පස්වන මට්ටම - 2021/2022

අවසාන පරීක්ෂණය 2022

STU5512/STU5526 - අධ්‍යාපනයේ පදනම

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2022.12.02 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. ෆවුරේ වාර්තාවේ අධ්‍යාපන සංකල්පය හැඳින්වූයේ "දිවි පැවැත්ම සඳහා ඉගෙනුම" යනුවෙනි. එයින් අදහස් කරන්නේ කුමක් ද? උදාහරණ දෙකක් (02) සපයන්න.

02. රූසෝ විසින් යෝජනා කරන ලද අධ්‍යාපන අවධි පහ (05) දක්වන්න.

03. "ප්‍රාථමික සමාජානුයෝජනය" යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?

04. 'විනය' යන සංකල්පයෙහි වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න.

05. මර්ඩොක් විසින් සඳහන් කරන ලද පවුලක මූලික කාර්යයන් හතර (04) මොනවා ද?

06. "විධිමත් අධ්‍යාපනය" යන සංකල්පය සැකෙවින් පැහැදිලි කරන්න.

07. අධ්‍යාපනය පරිභෝජනයක් ලෙස සැලකීමට හේතු තුනක් (03) දක්වන්න.

08. පුනරාවර්තන අධ්‍යාපනයේ ප්‍රධාන අපේක්ෂාව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05x 08 = 40)

## 2 වන කොටස

09. (i) ඩෙලෝස් වාර්තාවේ හඳුන්වා දුන් අධ්‍යාපනයේ ස්ථම්භ හතර (04) මොනවා ද? (ලකුණු 04)

(ii) සිසුන් තුළ සමබර පෞරුෂයක් ගොඩනැගීම සඳහා ඉහතින් සඳහන් කළ අධ්‍යාපනයේ ස්ථම්භ හතර වැදගත් වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) අද ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අධ්‍යාපන ක්‍රමය පුද්ගලයාගේ අත, හිස සහ හදවත සංවර්ධනය කිරීමට ඉවහල් වන්නේ කෙසේද යන්න විභාග කරන්න. (ලකුණු 08)

10. (i) ජෝන් ඩූවීගේ අධ්‍යාපන දර්ශනයේ ලක්ෂණ හතරක් (04) දක්වන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලාංකික සන්දර්භය තුළ විෂයමාලා සැකසීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී ජෝන් ඩූවීගේ විෂයමාලාව පිළිබඳ අදහස් කෙතරම් දුරට වැදගත් වේදැයි විභාග කරන්න. (ලකුණු 08)

(iii) ගුරුවරුන් විසින් සකස් කරන ලද ආදර්ශයන් දරුවන්ගේ ආකල්ප සංවර්ධනයට බලපාන්නේ කුමන ආකාරයෙන්ද? උදාහරණ දෙකක් (02) සමගින් ඔබේ පිළිතුර විස්තර කරන්න. (ලකුණු 08)

11. (i) මනෝවාලක ක්ෂේත්‍රයෙහි වැදගත්කම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සමාජ වෙනස්වීම් සමඟ අධ්‍යාපන අරමුණු වෙනස්විය යුත්තේ ඇයිදැයි උදාහරණ දෙකක් (02) මගින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) අධ්‍යාපනික අරමුණු හා පරමාර්ථ ගොඩනැගීමේ අවශ්‍යතාව උදාහරණ හතරක් (04) ගෙන පැහැදිලි කරන්න. (ලකුණු 08)

12. (i) 'සමාජ ස්ථරායනය' යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) පුද්ගලයන්ගේ ධනාත්මක සමාජ සඵලතාවක් ප්‍රවර්ධනය කිරීමේ දී අධ්‍යාපනය උදව් වන්නේ කෙසේද යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) ළමයින්ගේ සමාජානුයෝජන ක්‍රියාවලියේ දී සමවයස් කණ්ඩායම් වැදගත් භූමිකාවක් ඉටු කරන්නේ යැයි ඔබ සිතනවා ද? හේතු හතරක් (04) ගනිමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. (i) පර්යේෂකයින් සිසුන් ව සමාජමිතික තත්ත්ව කණ්ඩායම් පහකර වර්ග කර තිබේ . ඉන් කණ්ඩායම් හතරක් (04) නම් කරන්න. (ලකුණු 04)

(ii) විධිමත් අධ්‍යාපනයේ දුර්වලතාවලට ප්‍රතිකර්මයක් ලෙස නොවිධිමත් අධ්‍යාපනය ක්‍රියාකරන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) විවෘත අධ්‍යාපන සංවර්ධනයට අදාළ ක්‍රමෝපායන් හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 08)

14. පහත දැක්වෙන ඕනෑම මාතෘකා දෙකක් (02) පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

i. ජාතික අධ්‍යාපන කොමිසම හඳුන්වා දුන් නිපුණතා දෙකක්
ii. මහත්මා ගාන්ධිතුමාගේ අධ්‍යාපනික යෝජනා
iii. ප්ලේටෝගේ අධ්‍යාපනික චින්තාවන්
iv. විධිමත් අධ්‍යාපනයේ දුර්වලතා (ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.